ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම
අවසාන පරීක්ෂණය - පළමු අර්ධ වර්ෂය 2021/2022
**DSD4502– ව්‍යාපෘති සැලසුම්කරණය, අධීක්ෂණය සහ විශ්ලේෂණය**

කාලය : පැය දෙකයි (02)

දිනය : 04 – 06 – 2022 වේලාව : පෙ.ව 9.30 – පෙ.ව 11.30

උපදෙස් :

- ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරු අපේක්ෂා කෙරේ.

01. ඔබ සාමාජිකත්වය දරණ තරුණ සංවිධානය ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය තුළ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් වියේ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට උපකාර කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අදහස් කරන බව සිතන්න. මේ සඳහා අරමුදල් සපයන සංවිධානයට ඉදිරිපත් කළ හැකි පූර්ණ ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන්න.

02. පහත සඳහන් කාර්යයන් දෙක ව්‍යාපෘති ලෙස සැලකිය හැකිද නැතහොත් ව්‍යාපෘතියක ලක්ෂණ භාවිතා නොකරන්නේද යන්න සාකච්ඡා කරන්න.

අ) වසර අවසානය දක්වා ආදායම් මාර්ගයක් ලෙස සබන් නිෂ්පාදනය කිරීම..

ආ) ඔබේ ප්‍රජාව තුළ පාසල් යන ළමුන් සඳහා පුස්තකාලයක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම

3. සැලසුම් කිරීම මූලික මිනිස් ක්‍රියාවලියක් වන අතර එහි ලක්ෂණයන් අපගේ ජීවිතයේ සාමාන්‍ය අංගයක් වේ. ව්‍යාපෘති සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම බොහෝ එදිනෙදා සැලසුම් වලට වඩා සංකීර්ණ ක්‍රියාවලින් වේ. සැලසුම් කිරීමේ වාසි සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න.

4. ඔබේ අත්දැකීම් අනුව සුදුසු උදාහරණ භාවිතා කරමින් පාර්ශවකරුවන්ගේ විශ්ලේෂණයක් (stakeholder analysis) පැවැත්වීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

5. ඔබේ අභිමතය පරිදි ව්‍යාපෘතියක් තෝරා සුදුසු ප්‍රස්ථාර /රූප සටහන් භාවිතයෙන් ගැටලු ගසක් නිර්මාණය කරන්න. ප්‍රස්ථාරයේ/රූප සටහනේ සඳහන් කර ඇති කරුණු පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

6. ව්‍යාපෘති අරමුණු තෝරාගැනීමේදී සලකා බැලිය යුතු කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

7. ව්‍යාපෘතිවල සම්බන්ධීකරණයේ වැදගත්කම කුමක්ද? උදාහරණ භාවිතා කරමින් විස්තර කරන්න.

8. වගකීම අත්‍යාවශ්‍ය වේ - එය ඔබගේ පුද්ගලික වගකීමක් ද වේ - එය ස්වයංක්‍රීය විය යුතුය..තරුණ සේවකයෙකු සඳහා වගවීම අත්‍යාවශ්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

9. උදාහරණ භාවිතා කරමින් පහත දැක්වෙන කෙටි සටහන් ලියන්න

අ) SMART සංකල්පය

ආ) තත්ව විශ්ලේෂණයේ සාධක

ඇ) ප්‍රාථමික පාර්ශවකරුවන්

ඈ) ව්‍යාපෘති අරමුණු ලිවීම සඳහා ඉඟි

******************** සියළුම හිමිකම් ඇවිරිණි*********************